ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கைச் சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Act No.13 of 1957
Reg.by Boy Scout International Bureau on -22.02.1953

**2026.02.17** ***චක්‍රලේඛ අංක : 15 /2026***

**සියළුම දිසා කොමසාරිස්වරුන් හා සහාය දිසා කොමසාරිස් (පුහුණු) වෙත,**

## සිගිති බාලදක්ෂ – ලී පදක්කම් පුහුණුව

### 06 වන IV අදියර සිගිති බාලදක්ෂ උසස් පාඨමාලාව
### 2026 අප්‍රේල් මස 06 සිට 11 දක්වා
### මීරිගම ලී දසනායක බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයේ දී

**සිගිති බාලදක්ෂ** අංශයේ III අදියර සාර්ථකව නිම කළ නායක/නායිකාවන් සඳහා IV වන අදියර **සිගිති බාලදක්ෂ** උසස් පාඨමාලාව **2026 අප්‍රේල් මස 06 වන සඳුදා සිට 11 වන සෙනසුරාදා දක්වා** මීරිගම ලී දසනායක බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයේ දී පුහුණුකිරීමේ නායක **ගීත් රමේෂ් මහතාගේ** අධ්‍යක්ෂණය යටතේ පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

ඒ සඳහා මේ සමග අමුණා ඇති අයදුම් පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර, **2026 පෙබරවාරි මස 25 වන දිනට ප්‍රථම** ජාතික බාලදක්ෂ මූලස්ථානයට යොමු කරවීමට කටයුතු කරන්න.

පාඨමාලා ගාස්තුව රු. 5,500/- කි.

තෝරා ගන්නා ලද අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණය **2026 පෙබරවාරි මස 28 වන සෙනසුරාදා දින** පෙ.ව 10.00 ට ජාතික බාලදක්ෂ මූලස්ථානයේ දී පැවැත් වේ.

- **IV අදියර බාලදක්ෂ නායක උසස් පාඨමාලාවට සහභාගීවීමට තිබිය යුතු සුදුසුකම්**
  - i. III අදියර සාර්ථකව නිමා කර තිබීම.
  - ii. 2025 වසර සඳහා නව අධිකාරි පත්‍රයක් ලබා තිබීම හෝ 2025 වසරට නවීකරණය කර තිබීම.
  - iii. මීට පෙර වෙනත් අංශයකින් IV අදියර පාඨමාලාවක් හදාරා ඇත්නම්, එම අංශයෙන් ලී පදක්කම දිනා, එම අංශයට වසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.
  - iv. 2 වන අදියර සහතිකය (2 වන අදියරින් පසු පාඨමාලාව පටන් ගන්නා දිනට මාස 06 ක සේවා කාලයක් තිබිය යුතු ය.)

- **සම්මුඛ පරීක්ෂණයට පැමිණීමේදී රැගෙන ආ යුතු දේ :**
  1. තම අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය රැගෙන ආ යුතු ය.
  2. දින 06 ක් ප්‍රායෝගික ව නේවාසික පුහුණුව ලැබීමට සුදුසු සෞඛ්‍ය තත්ත්වයේ සිටින බවට වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කල යුතු ය.

65
9
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,කොළඹ 02, ශ්‍රී ලංකා
சர். சிற்றம்பலம் ஏ. கார்டினர் மாவத்தை,கொழும்பு 02. இலங்கை.
Sir Chittampalam A Gardiner Mawatha,Colombo 02,Sri Lanka
Tel : +94 11 2 433 131/+94 11 5 231512
Fax : +94 11 2 433 131
E-mail: slsaheadq@gmail.com
Web : www.scout.lk

3. **2 වන අදියර සහතිකය (2 වන අදියරින් පසු මාස 06 ක සේවා කාලයක් තිබිය යුතු ය.)**

4. **වලංගු අධිකාරී පත්‍රයේ පිටපතක්**

5. **බාලදක්ෂ නායක ප්‍රගති පුහුණු වාර්තා පොත (1-5 පොත) සම්පූර්ණ කර පැමිණීම.**

6. **එදින සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වුවහොත් පාඨමාලා ගාස්තු ගෙවීමට මුදල් රැගෙන ආ යුතු ය.**

**<u>සැලකිය යුතු කරුණු</u> :**

- ✓ **අධිකාරී පත්‍රයක් නොමැති කිසිවකු පාඨමාලාවට ඇතුලත් නොකෙරේ.**
- ✓ **පාඨමාලාවට ඇතුළත් කිරීමෙන් පසු දැනුම් දීමක් කර, සහභාගි නොවුවහොත් පමණක් ගෙවූ මුදලින් 75% ක් ආපසු ගෙවනු ලැබේ.**

**ඉදිරි කටයුතු සංවිධානය කිරීමේ පහසුව උදෙසා නියමිත කාලය තුළ දී අයදුම් පත්‍ර යොමු කරවීමට කටයුතු කරණ ලෙස කාරුණික ව දැනුම් දෙමු.**

**ස්තූතියි.**

**මෙයට,**
**බාලදක්ෂ සේවයේ නියුතු,**

**කර්නල් පද්මලාල් පෙරේරා**
**ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්**

**නිතීඥ මනෝජ් නානායක්කාර**
**ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්**

<u>පිටපත</u> - 1. **ජාතික බාලදක්ෂ මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන්**
2. **සභාපති/විධායක කමිටු සභාපති/ගරු ලේකම්/ගරු භාණ්ඩාගාරික - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය**